චක්‍රලේඛ අංක : 02/2016

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක : 109, 4 වන මහල,
මහා වීදිය,
බත්තරමුල්ල.
2016. | 06 | 27

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා
අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**සාමාන්‍යාධිකාරීන් වෙත කළමනාකරණ අවදානම් දීමනාවක් ගෙවීම.**

බස්නාහිර පළාත් විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රධාන විධායක තනතුර උසුලන සාමාන්‍යාධිකාරීවරුන් වෙත කළමනාකරණ අවදානම් දීමනාවක් ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ, 2014-02-28 දාතමැති බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අංක: 04/2014 චක්‍රලේඛය සම්බන්ධයෙන් 2016-05-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් සංශෝධනයන් සිදු කිරීමට බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

I. **04/2014 චක්‍රලේඛයේ I වගන්තිය**

බස්නාහිර පළාතේ සමුපකාර සමිතියක 101:03 හෝ ඊට ඉහළ වැටුප් පරිමාණ අංකයක් යටතේ, ස්ථිර / වැඩ බැලීමේ / රාජකාරි ඉටු කිරීමේ පදනම මත සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී තනතුරට පත් කිරීම සඳහා බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලත් නිලධාරීන් සඳහා, 04/2014 චක්‍රලේඛයේ II වගන්තිය මගින් නියම කර ඇති සීමාවන්ට යටත්ව කළමනාකරණ අවදානම් දීමනාවක් ගෙවිය යුතු වේ.
රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කර සිටින නිලධාරීන් සඳහා හිමි වන්නේ නියමිත දීමනාවෙන් අඩක් පමණි.
වැඩ බැලීමේ / රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කරනු ලැබූ නිලධාරීන් සඳහා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පත්වීම් කාල සීමාව සඳහා පමණක් මෙම දීමනා හිමිකම පවතී.

II. **04/2014 චක්‍රලේඛයේ III වගන්තිය**

වැඩ ආවරණය කිරීම සඳහා පත් කර ඇති නිලධාරීන්ට මෙම දීමනාව හිමි නොවන අතර, කොමිෂන් සභාවේ අනුමැතිය මත සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් පත් කරනු ලැබූ නිලධාරීන්ගේ කොන්ත්‍රාත් දීමනාව තීරණය කිරීමේ දී මෙම කළමනාකරණ අවදානම් දීමනාව සැලකිල්ලට ගැනීමෙහි බාධාවක් නැත.

02. 04/2014 චක්‍රලේඛයේ අනෙකුත් විධිවිධානයන්හි කිසිදු වෙනසක් සිදු නොවේ.

කොමිෂන් සභා නියමය පරිදි.

එස්. ඒ. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

I. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
II. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
III. සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.
IV. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ ගම්පහ/ කළුතර)
V. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
VI. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
VII. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
VIII. සියළුම වෘත්තීය සමිති සංගම්